# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 10 දරන පොදු පහසුකම් මණ්ඩල පනත

[සහතිකය සටහන් කළේ 1973 මාර්තු මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1973 මාර්තු මස 30 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබා ගත හැකිය.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 10 දරන
පොදු පහසුකම් මණ්ඩල පනත

[සහතිකය සටහන් කළේ 1973 මාර්තු මස 20 වන දින]

එල්.ඩී.—ඕ. 13/72.

**ඉඩ ඒකකවල පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග පිළිබඳ පාලනය හා කළමනාකරණය ගෙන යෑම, ඒවා නඩත්තු කිරීම සහ පරිපාලනය කිරීම සඳහා සහ ඒ ඒකකවලට පොදු පහසුකම් සැලැස්වීම සඳහා පොදු පහසුකම් මණ්ඩලය යනුවෙන් හැඳින්වෙන රාජ්‍ය අධිකාරියක් පිහිටුවීම සඳහාත් ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික හෝ කරුණු සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 10 දරන පොදු පහසුකම් මණ්ඩල පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**පොදු පහසුකම් මණ්ඩලය.**

2. ("මණ්ඩලය" යනුවෙන් මෙහි මින් මතු සඳහන් කරනු ලබන) පොදු පහසුකම් මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන රාජ්‍ය අධිකාරියක් පිහිටුවනු ලබන අතර, එය 8 වන වගන්තිය යටතේ මණ්ඩලයේ තත්කාලයේ සාමාජිකයින් වන තැනැත්තන්ගෙන් සමන්විත වන්නේය.

**මණ්ඩලය සංස්ථාවක් වන බව.**

3. 2 වන වගන්තියෙන් මණ්ඩලයට දෙන ලද නාමයෙන් මණ්ඩලය සංස්ථාවක් වන්නේය. එයට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ද ඇත්තේය. තව ද ඒ නාමයෙන් මණ්ඩලය විසින් නඩු පැවරිය හැකිය. එම නාමයෙන් එයට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකිය.

**පනත අදාළවීම.**

4. (1) (අ) පොදු පහසුකම් හෝ අංගෝපාංග එකක් හෝ වැඩි ගණනක් සලසනු ලැබ ඇති, වාසය සඳහා වූ ඒකකවල හෝ වාසය සඳහා නොවූ ඒකකවල සියයට හැත්තෑපහකට නොඅඩු ඒකක සංඛ්‍යාවක අයිතිකරු විසින් හෝ අයිතිකරුවන් විසින් හෝ මේ පනතේ විධිවිධාන එම ඒකකවලට අදාළ කරන ලෙස ලිය විල්ලකින් ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක; හෝ

(ආ) මණ්ඩලය මණ්ඩලයේම ඔනෑකම පිට—

(i) එකී ඒකකයක හෝ ඒකක වැඩි ගණනක ඇති පොදු පහසුකම්වල හෝ පොදු අංගෝපාංගවල පාලනය, පරිපාලනය නඩත්තුව හෝ කළමනාකරණය අසතුටුදායක යයි; හෝ

(ii) එකී ඒකකවලට අතිරේක පොදු පහසුකම් සැලසිය යුතු යයි

අදහස් කරන අවස්ථාවක

මේ පනත යටතේ මණ්ඩලයට පවරනු ලැබූ බලතල මණ්ඩලය විසින් ඉහත කී ඒකක සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ හැකිය. මණ්ඩලය ඒ බලතල ක්‍රියාත්මක කරනු ලබන්නේ යම් ඒකක සම්බන්ධයෙන් ද ඒ ඒකක මෙහි මින්මතු "අදාළ ඒකක" යනුවෙන් සඳහන් කරනු ලැබේ:

එසේ වුව ද, ඉහත කී ඒකක ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට, පළාත් පාලන ආයතනයකට හෝ රාජ්‍ය සංස්ථාවකට අයිති අවස්ථාවක ඒ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවේ, පළාත් පාලන ආයතනයේ හෝ රාජ්‍ය සංස්ථාවේ ඉල්ලීම පිට හැර මණ්ඩලය විසින් ඒ බලතල ක්‍රියාත්මක නොකළ යුතුය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් බලතල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීමට පෙර එසේ කිරීමේ අදහස, ඊට හේතු ද සමග, ඉල්ලීම කරන පාර්ශ්වයක් වුවහොත් ඒ පාර්ශ්වයට ද ඒ ක්‍රියාත්මක කිරීම බලපෑමට ඉඩ ඇති සෑම ඒකකයකම අයිතිකරුට ද දැනුම් දිය යුතුය.

(3) යම් ඒකකයක අයිතිකරු විසින් මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වූ දැනුම්දීම ඔහුට ලැබීමෙන් පසු දින දහ හතරක් ඇතුළත තම ඒකකය සම්බන්ධයෙන් (1) වන උපවගන්තියෙහි සඳහන් බලතල ක්‍රියාත්මක කිරීමේ මණ්ඩලයේ අදහසට විරුද්ධව ලියවිල්ලකින් වූ අභියාචනයක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකිය. අභියාචනයට හේතු වූ කරුණු එහි සඳහන් විය යුතුය.

(4) (1) වන උපවගන්තියෙහි සඳහන් බලතල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම හෝ අභියාචනයක් ඉදිරිපත් කරන ලද විටක අමාත්‍යවරයාගේ තීරණය හෝ යම් අධිකරණයක දී හෝ විනිශ්චය අධිකාරයක දී හෝ ප්‍රශ්න නොකළ යුතුය.

මණ්ඩලයේ අරමුණු.

5. මණ්ඩලයේ අරමුණු—

(අ) අදාළ ඒකකවල පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග පිළිබඳ පාලනය හා කළමනාකරණය ගෙන යාම, ඒවා නඩත්තු කිරීම සහ පරිපාලනය කිරීම;

(ආ) ගින්නෙන්, මහජන කැළඹීම්වලින් සහ කැරලි කෝලාහල වලින් වන උපද්‍රව සම්බන්ධයෙන් එකී ඒකක පිහිටි සියලුම ගොඩනැගිලි රක්ෂණය කරන ලෙස සහ රක්ෂණය වලංගුව තබා ගන්නා ලෙස අයිතිකරුවන් විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත්, එසේ රක්ෂණය කිරීම සහ රක්ෂණය වලංගුව තබා ගැනීම;

(ඇ) එකී ඒකකවල පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග මනා තත්ත්වයෙන් සහ සේවයට යොදවා ගත හැකි අන්දමින් සහ නිසි අන්දමින් නඩත්තු කොට තබා ගැනීම;

(ඈ) එකී ඒකක සම්බන්ධයෙන් ජල, කසළ කාණු, ජලාපවහන, ගෑස්, විදුලි, කුණුකසළ බැහැරකිරීම, වායු සමීකරණ, දුර කථන, ගුවන් විදුලි සහ රෙඩිෆියුෂන් සේවාවන් ඇතුළු සේවාවන් සැපයීම සහ නඩත්තු කිරීම;

(ඉ) එකී ඒකකවල පදිංචිකරුවන්ගේ පාවිච්චිය සඳහා මාර්ග, ප්‍රවේශයන්, තණ පිට්ටනි, වතු, උද්‍යාන, ක්‍රීඩාංගන සහ වෙනත් එළිමහන් භූමි ආදී පහසුකම් පිහිටුවා නඩත්තු කිරීම ;

(ඊ) එකී ඒකකවල පදිංචිකරුවන්ගේ යහපත සහ ශුභසාධනය සඳහා පොදු සේවාවන් සැපයීම ;

(උ) රජයේ හෝ සමූපකාර හෝ පෞද්ගලික අංශයේ හෝ නියෝජිත ආයතන මගින් නැතහොත් තැනැත්තන් මගින් ඉහත කී අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා සංවිධාන ඇති කිරීමට අනුබල දීම ;

(ඌ) මණ්ඩලය විසින් නඩත්තු කරනු ලබන පොදු පහසුකම්වල හෝ පොදු අංගෝපාංගවල නඩත්තුව පළාත් පාලන ආයතන විමසීමෙන් පසු ඒ ආයතනවලට හෝ යෝග්‍ය විට ඒකකවල අයිතිකරුවන්ගේ මණ්ඩලවලට හෝ සංගම් වලට පැවරීම ;

(එ) ඒ ඒකකවල අයිතිකරුවන්ගේ හෝ පදිංචිකරුවන්ගේ ඉල්ලීම පිට, ඒ ඒකකවලට ඒවා නඩත්තු කිරීමේ සහ අලුත්වැඩියා කිරීමේ සේවාවන් සැපයීම ; සහ

(ඒ) ඉහත කී අරමුණු අතුරින් යම් අරමුණකට සම්බන්ධ යයි හෝ අනුයාත යයි සැලකිය හැකි යම් අරමුණක් ක්‍රියාත්මක කිරීම

යන මේවා විය යුතුය.

මණ්ඩලයේ බල තල.

6. මණ්ඩලයේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් සඳහා මණ්ඩලයට පහත සඳහන් සියලුම බලතල හෝ ඒ බලතල අතුරින් කිසිවක් තිබිය යුතු අතර, මණ්ඩලය විසින් ඒවා ක්‍රියාවෙහි යොදවනු ලැබිය හැකිය :—

(අ) යම් නිශ්චල හෝ චංචල දේපළ අත්කර ගැනීම හෝ ත්‍යාගයක් වශයෙන් හෝ අන් ලෙසකින් එය පිළිගැනීම සහ ඒ දේපළ තබා ගැනීම, ඒ පිළිබඳ කළමනාකරණය කරගෙන යාම, එය විකිණීම, ආපසු භාරදීම, හුවමාරු කිරීම, බදුදීම හෝ අන් ලෙසකින් බැහැර කිරීම ;

(ආ) මුදල් ආයතනවලින් හෝ වෙනත් මාර්ගවලින් මුදල් ණයට ගැනීම ;

(ඇ) මණ්ඩලය විසින් කුලියට දී ඇති යම් ඉඩමක් හෝ ගොඩනැගිලි සඳහා කුලිය අයකර ගැනීම ;

(ඈ) මණ්ඩලයේ අරමුණු ක්‍රියාත්මක කිරීමෙහි ලා මණ්ඩලය විසින් ඉටු කරනු ලබන යම් සේවාවක් සඳහා ගාස්තු අයකර ගැනීම ;

(ඉ) ඒකකවලට අයිතිකරුවන්ගේ ඇති සම්බන්ධතාවලට සමානුපාතිකව ඔවුන්ගෙන් යම් වාර මුදල් ලබාගැනීම ;

(ඊ) අයිතිකරුවකු ද ඇතුළුව යම් තැනැත්තකු විසින් ඒකකවල පොදු පහසුකම්වලට හෝ පොදු අංගෝපාංගවලට කරන ලද යම් හානියක් යථා තත්ත්වයට ගෙන ඊමෙහි ලා දරන ලද වියදම් ඒ තැනැත්තාගෙන් ලබාගැනීම;

(උ) යම් ඒකකයක අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ හෝ ඉල්ලීම පිට ඒ ඒකකයට ඒකකය අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම ඇතුළු යම් සේවාවන් සැපයීම සහ ඒ වෙනුවෙන් ගාස්තු අයකිරීම;

(ඌ) වෙනත් ඒකකවලටත් නැතහොත් ඒකකවල පොදු අංගෝපාංගවලටත් සේවය සලසන නළ, කම්බි, කේබල් සහ ප්‍රණාල පරීක්ෂා කිරීමේ, අලුත්වැඩියා කිරීමේ හෝ අලුත් කිරීමේ කාර්යය සඳහා හෝ ඒකකවල පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග නඩත්තු කිරීමේ, අලුත් කිරීමේ හෝ අලුත්වැඩියා කිරීමේ කාර්යය සඳහා හෝ අදාළ යම් ව්‍යවස්ථාපිත නියමයන් පිළිපැදිනු ලබන බවට වග බලාගැනීමේ කාර්යය සඳහා හෝ මේ වගන්තියේ හෝ 4(1) වන වගන්තියේ හෝ සඳහන් බලතල අතුරින් කිසිවක් ක්‍රියාවෙහි යෙදවීමේ දී හෝ එබඳු යම් ඒකකයකට සියලුම යුක්ති සහගත වේලාවන්වලදී, මණ්ඩලය විසින් හෝ එහි විධිමත් ලෙස බලයලත් අනුයෝජිතයින් විසින් ඇතුළුවීම;

(එ) මණ්ඩලයේ අරමුණු අතුරින් යම් අරමුණක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා යුක්ති සහගතව අවශ්‍ය විය හැකි ගිවිසුම්වලට ඇතුළත්වීම සහ වැඩ පිළිවෙලවල් සකස් කිරීම;

(ඒ) මණ්ඩලයේ කටයුතු කරගෙන යෑමට අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවකයන් සේවයෙහි යෙදවීම;

(ඔ) මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම සඳහා රීති සෑදීම;

(ඕ) මණ්ඩලයේ අරමුණු නිසි ලෙස ක්‍රියාත්මක කිරීම පහසු කිරීමට, මණ්ඩලයේ මතය අනුව අවශ්‍ය විය හැකි සියලුම දේවල් කිරීම.

පොදු පහසුකම් වල සහ පොදු අංගෝපාංගවල පාලනය, නඩත්තුව ආදිය මණ්ඩලය විසින් ඒකකවල අයිති කරුවන් වෙත පැවරිය හැකි බව.

7. අදාළ ඒකක සමූහයක සියලුම ඒකකවල අයිතිකරුවකු හෝ අයිතිකරුවන් විසින් ඉල්ලුම් කළ විට හා ඒ ඒකකවල පොදු පහසුකම් හෝ පොදු අංගෝපාංග නිසි පරිදි පාලනය කිරීමේ, නඩත්තු කිරීමේ, කළමනාකරණය කිරීමේ හා පරිපාලනය කිරීමේ හැකියාව එකී අයිතිකරුට හෝ අයිතිකරුවන්ට ඇති බවට මණ්ඩලය සෑහීමට පත්වුවහොත්, මේ පනත යටතේ එකී ඒකකවලට අදාළ මණ්ඩලය සතු බලතල මණ්ඩලය වෙතින් ඉවත්කර එකී පොදු පහසුකම්වල හෝ පොදු අංගෝපාංගවල පාලනය, නඩත්තුව, කළමනාකරණය සහ පරිපාලනය එකී අයිතිකරු හෝ අයිතිකරුවන් හෝ එකී අයිතිකරුවන්ගේ යම් සංගමයක් හෝ මණ්ඩලයක් හෝ වෙත පැවරිය හැකිය.

8. (1) මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය:— සැදුම්ය.

(අ) පහත සඳහන් ධුරවල යුතුකම් තත්කාලයේ ඉටු කරන තැනැත්තන්:—

(i) ජාතික නිවාස කොමසාරිස්,

(ii) ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී,

(iii) ජලසම්පාදන සහ ජලාපවහන අධ්‍යක්ෂ,

(iv) පළාත් පාලන කොමසාරිස්,

(v) ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ජල සම්පාදන සහ කසළ කාණු පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු,

(vi) කොළඹ නාගරික කොමසාරිස්,

(vii) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී.

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන ("නිල නොලත් සාමාජිකයින්" ලෙස මෙහි මින් මතු සඳහන් කරනු ලබන) වෙනත් තැනැත්තන් දෙදෙනකු.

(2) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සාමාජිකයින් අතුරින් මණ්ඩලයේ සභාපතිවරයා සහ උප සභාපතිවරයා පත් කරනු ලැබිය යුතුය.

(3) යම් තැනැත්තකු ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකු නම් හෝ ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකු බවට පත් වුවහොත් ඔහු මණ්ඩලයේ නිල නොලත් සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ නිල නොලත් සාමාජිකයකු වශයෙන් ධුර දරමින් සිටීමට සුදුසු නොවිය යුතුය.

(4) මණ්ඩලයේ නිල නොලත් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම අවස්ථානුකූල යයි අමාත්‍යවරයා අදහස් කළහොත්, ඔහු විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, කිසිම හේතුවක් සඳහන් නොකර එසේ ඒ සාමාජිකයා ඉවත් කරනු ලැබිය හැකිය.

(5) මණ්ඩලයේ නිල නොලත් සාමාජිකයකු විසින් අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් ඕනෑම වේලාවක දී තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(6) මණ්ඩලයේ යම් නිල නොලත් සාමාජිකයකු අසනීපවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙන යම් හේතුවක් නිසා හෝ ඔහුගේ ධුරයේ යුතුකම් ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට අමාත්‍යවරයා විසින් වෙන යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකිය.

(7) මණ්ඩලයේ සෑම නිල නොලත් සාමාජිකයකුම මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා තම ධුරය හිස් කරත හොත් මිස අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතුය.

(8) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි යම් සාමාජිකයකු පත්කිරීමේ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතුය.

(9) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය පස් දෙනකු විය යුතුය.

රැස්වීම්වල මූලාසනය දැරීම.

9. (1) මණ්ඩලයේ සියලුම රැස්වීම්වල දී මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටියහොත් ඔහු මූලාසනය දැරිය යුතුය. සභාපතිවරයා එකී යම් රැස්වීමකට නොපැමිණියහොත් උපසභාපතිවරයා මූලාසනය දැරිය යුතුය. සභාපතිවරයා සහ උපසභාපතිවරයා යන දෙදෙනාම එකී යම් රැස්වීමකට පැමිණ නොමැති අවස්ථාවක පැමිණ සිටින සාමාජිකයින් විසින් රැස්වීමේ මූලසුන දැරීම සඳහා තමන් අතුරින් කෙනකු තෝරා ගත යුතුය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක සභාපතිවරයාට තම ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් ද තිබිය යුතුය.

කාර්ය පරිපාටිය විධිමත් කිරීම.

10. මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව මණ්ඩලයේ සාමාජිකයින් විසින් මණ්ඩලයේ රැස්වීම්වල කාර්ය පරිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු විධිමත් කරනු ලැබිය හැකිය.

මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් රාජ්‍ය නිලධරයන් ලෙස සැලකිය යුතු බව.

11. මණ්ඩලයේ සියලුම නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යයන් සඳහා රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය.

මණ්ඩලය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

12. මණ්ඩලය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතුය.

මණ්ඩලයේ මුද්‍රාව.

13. (1) මණ්ඩලයේ මුද්‍රාව මණ්ඩලය භාරයෙහි තිබිය යුතුය.

(2) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකින් මණ්ඩලයේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකිය.

(3) මණ්ඩලයේ මුද්‍රාව තැබීම, මණ්ඩලයේ සභාපතිවරයාගේ අත්සනින් හෝ ඒ මුද්‍රාව තැබීම සහතික කිරීමට මණ්ඩලය විසින් බලය දෙන ලද මණ්ඩලයේ වෙන යම් සාමාජිකයෙකුගේ අත්සනින් හෝ සහතික කරනු ලැබිය යුතුය.

මණ්ඩලයේ අනුයෝජිතයා.

14. (1) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්, පළාත් පාලන ආයතනයක්, රාජ්‍ය සංස්ථාවක් හෝ සමුපකාර හෝ පෞද්ගලික වාණිජ ව්‍යාපාරයක් විසින් හෝ යම් තැනැත්තකු විසින් හෝ ඉල්ලුම් කරනු ලැබූ විට ඉල්ලුම්කරුට භාරදෙනු ලබන වැඩක්

කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා ඉල්ලුම්කරුගේ යෝග්‍යතාව හා සුදුසුකම ගැන මණ්ඩලය සෑහීමට පත්වුවහොත් මණ්ඩලය විසින් ඒ ඉල්ලුම්කරු මණ්ඩලයේ අනුයෝජිතයකු වශයෙන් ලියා පදිංචි කළ හැකිය.

(2) මණ්ඩලයේ කාර්යයන්ට ඇතුළත් වන යම් වැඩක් කරගෙන යාම සඳහා (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද අනුයෝජිතයකු සමඟ මණ්ඩලය විසින් ගිවිසුමකට එළඹිය හැකිය.

මණ්ඩලය විසින් වියදම් ගෙවනු ලැබීම සහ මණ්ඩලයට ලැබිය යුතු මුදල් ලබා ගැනීම.

15. (1) මේ පනත යටතේ මණ්ඩලය වෙත පවරනු ලැබ ඇති වෙනත් බලතලවලට අතිරේකව, මණ්ඩලයේ බලතලවලට පහත සඳහන් බලතල ද ඇතුළත් විය යුතුය:—

(අ) අදාළ ඒකකවල පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග පාලනය කිරීම, නඩත්තු කිරීම, ඒ පිළිබඳ කළමනාකරණය ගෙන යෑම සහ ඒවා පරිපාලනය කිරීම සඳහාත් යම් රක්‍ෂණ වාර මුදලක් ගෙවීම සඳහාත් මණ්ඩලයේ වෙන යම් බැඳීම් ඉටු කිරීම සඳහාත් මණ්ඩලයේ මතය අනුව අවශ්‍ය වියදම් දැරීම;

(ආ) (අ) ඡේදයේ සඳහන් කාර්යයන් සඳහා අයිතිකරුවන් ගෙන් ලබා ගත යුතු මුදල් කලින් කල නිශ්චය කොට ලබා ගැනීම;

(ඇ) මණ්ඩලය විසින් හෝ මණ්ඩලයේ විධානය යටතේ හෝ කරන ලද අලුත්වැඩියා කිරීම් වෙනුවෙන් හෝ දරන ලද වෙන යම් වියදම් වෙනුවෙන් හෝ ඒකකයක යම් අයිතිකරුවකුගෙන් මණ්ඩලයට අයවිය යුතු යම් මුදලක් ඔහුගෙන් ලබාගැනීම.

(2) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ මණ්ඩලයට අයවිය යුතු යම් මුදලක්, ඒ මුදල අයවිය යුතුව ඇත්තේ ඒකකයක යම් අයිතිකරුවකුගෙන් ද ඒ අයිතිකරු විසින් ගෙවනු නොලැබූ අවස්ථාවක දී ඒ අයිතිකරුගෙන් අයවිය යුතු මුදල් ප්‍රමාණය මණ්ඩලයේ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් සහතික කරනු ලැබිය යුතු අතර ඒ සහතිකය නිකුත් කරනු ලැබූ බව ඒ අයිතිකරු වෙත දැන්විය යුතුය. එහෙත් යම් ඒකකයක අයිතිකරුට ඒ දැන්වීම නොලැබීම හේතුකොට ගෙන මේ වගන්තිය යටතේ කෘත්‍ය අවලංගු නොවිය යුතුය.

(3) (අ) (2) වන උපවගන්තිය යටතේ මණ්ඩලයේ සභාපතිවරයා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කරමින් මණ්ඩලයේ යම් නිලධරයකු හෝ සේවකයකු හෝ විසින්, මණ්ඩලයට අයවිය යුතු මුදල ලබාගැනීම සඳහා, අයිතිකරු පදිංචිව සිටින්නේ යම් මහේස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බල සීමාව ඇතුළත ද ඒ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක ඒ අයිතිකරුට අයත් සියලුම චංචල හෝ නිශ්චල දේපළ හෝ ඒ දේපළ අතුරින් යම් දේපළක් හෝ ඒ මුදල අයකර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි ඉන් කොටසක් හෝ තහනමට ගෙන විකිණීමට පිස්කල්ට බලය දෙමින් සහ නියම කරමින් ක්‍රියාවෙහි යෙදවීමේ ආඥාවක් ඔහු වෙත නිකුත් කරන ලෙස ඒ අධිකරණය විසින් විධාන කළ යුතු අතර, ඒ ක්‍රියාවෙහි

යෙදවීමේ ආඥාව ක්‍රියාත්මක කිරීම සහ එසේ තහනමට ගෙන විකිණීම සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයෙහි 226 සිට 297 දක්වා වූ වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය.

(ආ) මුදල් පිළිබඳව රික්වෙස්ට් අධිකරණයක් සතු අධිකරණ බලය සීමා කිරීම සම්බන්ධයෙන් වෙන යම් නීතියක කුමක් සඳහන් ව ඇත ද, මේ උපවගන්තියේ ඉහත දැක්වුණු විධිවිධාන යටතේ වූ යම් ඉල්ලීමක් භාරගැනීමට එබඳු යම් අධිකරණයකට බලය තිබිය යුතුය.

**ආරාවුල් මණ්ඩලය වෙත යොමු කළ යුතු බව.**

16. (1) පොදු පහසුකම් හෝ පොදු අංගෝපාංග එකක් හෝ එකකට වැඩි ගණනක් සපයා ඇති වාසය සඳහා වූ යම් ඒකකවල හෝ වාසය සඳහා නොවූ යම් ඒකකවල අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු හා වෙනත් එවැනි අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු හා අතර, එකී යම් ඒකකයක පාවිච්චිය හෝ පරිහරණය සම්බන්ධයෙන් හෝ එයට අනුබද්ධ පොදු පහසුකම් හෝ පොදු අංගෝපාංග භුක්තිවිඳීම සම්බන්ධයෙන් යම් ආරාවුලක් පැන නැංගාවූ අවස්ථාවක, අතෘප්තියට පත් තැනැත්තා විසින් ඒ ආරාවුල මණ්ඩලය වෙත යොමු කළ හැකි අතර මණ්ඩලය විසින් නිසි විභාගයකින් පසු යුක්ති සහගත යයි සහ සාධාරණ යයි මණ්ඩලයට පෙනී යන නියමයක් ඒ ආරාවුල සම්බන්ධයෙන් කළ යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය වෙත යොමු කරනු ලැබූ ආරාවුලක් සම්බන්ධයෙන් එම උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් කරනු ලබන යම් නියමයක් අනුව ක්‍රියා කිරීම ආරාවුලේ සෑම පාර්ශ්වකරුවකුගේම යුතුකම විය යුතුය.

**මණ්ඩලය විසින් රක්ෂණය කරනු ලැබීම.**

17. අදාළ ඒකක පිහිටා තිබෙන ගොඩනැගිලි, ගින්නෙන්, මහජන කැළඹීම්වලින් හෝ කැරලි කෝලාහලවලින් හෝ නිශ්චිතව සඳහන් කරනු ලබන අන් අනතුරුවලින් සිදුවන පාඩු හෝ හානි සම්බන්ධයෙන් රක්ෂණය කරන ලෙස සහ රක්ෂණය වලංගුව තබා ගන්නා ලෙස ඒකකවල හෝ යම් ඒකක සමූහයක හෝ සියයට හැත්තෑපහකට නොඅඩු ප්‍රමාණයක අයිතිකරු හෝ අයිතිකරුවන් විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත්, මණ්ඩලය විසින් එසේ රක්ෂණය කළ යුතු අතර, ඒ රක්ෂණය වලංගුව පවත්වා ගෙන යා යුතුය. තව ද, එකී රක්ෂණය සඳහා ගෙවන වාරිකය හෝ වාරික ඒකකවල සියලුම අයිතිකරුවන් විසින් තම තමන්ගේ සම්බන්ධතාවලට සමානුපාතිකව මණ්ඩලය වෙත ගෙවිය යුතුය :

එසේ වුව ද, මේ වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධාන යම් ඒකකයක අයිතිකරු විසින් ඔහුගේම යහපත තකා ඔහුගේම වියදමෙන් ඔහුගේ ඒකකය රක්ෂණය කිරීමේ අයිතිය කෙරෙහි බල නොපෑ යුතුය.

**මණ්ඩලයේ අරමුදල.**

18. (1) මණ්ඩලයට මණ්ඩලයේම අරමුදලක් තිබිය යුතුය.

(2) කවර හෝ මාර්ගයකින් මණ්ඩලයට ලැබෙන සියලුම මුදල් අරමුදලට බැර කළ යුතු අතර, මණ්ඩලය විසින් කරනු ලබන සියලුම ගෙවීම් ඒ අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

(3) මණ්ඩලයේ අරමුණු ක්‍රියාත්මක කරගෙන යාමේ කාර්යය සඳහා මණ්ඩලය විසින් නිදන් අරමුදලක් පවත්වාගෙන යා යුතුය.

ඒකාබද්ධ අරමුදලින් මණ්ඩලයට මුදල් ප්‍රදානය කිරීම.

19. මේ පනත ක්‍රියාත්මක වීමෙන් පසු හැකි තාක් ඉක්මණින්, අමාත්‍යවරයා විමසා මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයක් එසේ ඔහු විසින් නිශ්චය කරනු ලැබිය හැකි නියමයන් අනුව, ජාතික රාජ්‍ය සභාවේ පූර්ව අනුමැතිය ඇතිව ඒකාබද්ධ අරමුදලින් මණ්ඩලය වෙත ප්‍රදානය කරනු ලැබිය හැකිය.

සාමාජිකයින් ගේ පාරිශ්‍රමික.

20. මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ට හෝ සාමාජිකයින් අතුරින් යම් සාමාජිකයකුට, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික හෝ වෙනත් දීමනා මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය හැකිය.

1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන අදාළවීම.

21. 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මණ්ඩලයේ මුදල් පාලනය සහ ගණන් සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

මුදල් වර්ෂය.

22. මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය.

මණ්ඩලය සම්බන්ධයෙන් අමාත්‍යවරයා සතු බලතල.

23. (1) මණ්ඩලයේ යුතුකම් ඉටු කිරීම සහ බලතල ක්‍රියාවෙහි යෙදවීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් මණ්ඩලය වෙත පොදු හෝ විශේෂ විධාන ලියවිල්ලකින් දෙනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් එම විධාන ක්‍රියාත්මක කළ යුතුය.

(2) මණ්ඩලයේ දේපළ සහ ව්‍යාපාරය සම්බන්ධයෙන්, තමා විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකින් වාර වාර්තා, ගණන් සහ වෙනත් තොරතුරු තමා වෙත ඉදිරිපත් කරන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල ලියවිල්ලකින් මණ්ඩලය වෙත විධාන කරනු ලැබිය හැකි අතර, එකී සෑම විධානයක්ම මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුතුය.

(3) තමා විසින් නිශ්චය කරනු ලැබිය හැකි තැනැත්තකු හෝ තැනැත්තන් විසින් මණ්ඩලයේ සියලු කටයුතු හෝ ඒ කටයුතු අතුරින් යමක් හෝ විමර්ශනය කර ඒ පිළිබඳව වාර්තා කරන ලෙස අමාත්‍යවරයා විසින් නියමයක් කරනු ලැබිය හැකිය. එබඳු නියමයක් කරනු ලැබූ කල්හි මණ්ඩලය විසින් එකී නියමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විය හැකි සියලු පහසුකම් ලබාදිය යුතු අතර, එලෙස අවශ්‍ය විය හැකි සියලු තොරතුරු ද සැපයිය යුතුය.

නියෝග.

24. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ නියෝගයේ නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි තාක් ඉක්මණින් අනුමතිය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එය යටතේ කලින් කරන ලද යම් දෙයකට හානියක් නොමැතිව එහි අනනුමතියේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සැලකිය යුතුය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

(5) අමාත්‍යවරයා විසින් සාදනු ලබන යම් නියෝගයක් ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරනු ලැබූ විට එය මෙහි ලා පනවනු ලැබුවාක් මෙන් වලංගුව බලපැවැත්විය යුතුය.

වැරදි සහ දඬුවම.

25. (1) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ මේ පනත යටතේ නීත්‍යනුකූලව කරන ලද නියමයක් හෝ දෙන ලද විධානයක් හෝ උල්ලංඝනය කරන හෝ පිළිපැදීම පැහැර හරින සෝ සෑම තැනැත්තෙක්ම මේ පනත යටතේ වරදක් කරන්නේය.

(2) මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තකුම, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, හය මසකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම ද, ඒ වරද නොකඩවා කරගෙන යන වරදක් නම්, වරදකරු කිරීමෙන් පසු වරද නොකඩවා කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් එක සියයක අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

(3) වෙන යම් නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද මේ පනත යටතේ වූ සෑම වරදක්ම අපරාධ නඩු විධාන සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යයන් සඳහා සංඥෙය වරදක් වේ.

(4) සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක, ඒ වරද කරනු ලැබූ අවස්ථාවෙහි ඒ පුද්ගල මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරි, ලේකම් හෝ එවැනි වෙනත් නිලධරයකු ව සිටි සෑම තැනැත්තකුම තමාගේ අනුමතිය හෝ වරදෙහි නිසොල්මන්වීම නොමැතිව ඒ වරද කර ඇති බවත්, තම කාර්යවල ස්වභාවය හා එළඹ තිබුණු සියලු කරුණු ගැන සැලකිලිමත් ව තමා විසින් කළ යුතුව තිබූ පරිදි ඒ වරද කිරීම වැළැක්වීම පිණිස තමා නිසි සියලු උද්‍යෝගයෙන් ක්‍රියා කළ බවත් ඒ තැනැත්තා විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතුය.

මේ පනත වෙනත් ලිඛිත නීති අභිභවා බලපැවැත්විය යුතු බව.

26. වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන් ව ඇත ද මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතුය. ඒ අනුව මේ පනතේ විධිවිධාන සහ වෙනත් නීතියක විධිවිධාන හා අතර යම් ගැටීමක් හෝ නොගැළපීමක් ඇති වුවහොත් මේ පනතේ විධිවිධාන ඒ වෙනත් නීතිය අභිභවා බල පැවැත්විය යුතුය.

27. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"ඒකකය" යන්නෙන් (බලපත්‍රලාභීන්ගේ පදිංචිය හා ප්‍රයෝජනය සඳහා සැලසුම් කරන ලද යම් කාමරයක් හෝ කාමර නොවන) කාමර එකකින් හෝ එකකට වැඩි ගණනකින් සමන්විත වූ ද වෙනම පාවිච්චි කිරීම පිණිස සැලසුම් කරන ලද්දාවූ ද ස්ථිරව ආවෘත ඉඩ ප්‍රමාණයක්, ඉන් පිටත පිහිටියාවූ හා ඒකකයේ අයිතිකරුගේ තනි ප්‍රයෝජනය සඳහා වෙන් කරන ලද වාහනාගාර ඉඩකඩ, ගබඩා ඉඩ, වැසිකිළි, මෙහෙකරු කොටස්, සඳළුතල හෝ මළු වැනි අතිරේක ඒකක ද සමග, අදහස් වේ. එහෙත් ඒ ආවෘත ඉඩ ප්‍රමාණයේ සිට මාර්ගයට යා හැකි හෝ මාර්ගයට යොමු වූ පොදු ප්‍රදේශයකට කෙලින්ම පිටවීමේ මගක් තිබිය යුතු වුව ද ඒ ඉඩ ප්‍රමාණය ඔස්සේ ඒ ආකාරයේම වූ අන් කිසි ආවෘත ඉඩ ප්‍රමාණයකට යා හැකි නොවිය යුතුය;

"ගෙපත" යන්නෙන් එක් එක් නිවසට වැසිකිළි, නාන ස්ථාන, මුළුතැන්ගෙවල් හෝ ආලින්ද යන අංගවලින් කිසිවක් පොදුවේ ඇති වෙන වෙන ම වූ නිවාස දෙකකින් හෝ වැඩි ගණනකින් යුක්ත ගොඩනැගිල්ලක් අදහස් වේ;

"නියමිත" යන්නෙන් මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කරනු ලැබූ බව අදහස් වේ;

"නිවාස යෝජනා ක්‍රමය" යන්නෙන් පොදු පහසුකම් එකක් හෝ වැඩි ගණනක් සැපයෙන ලෙස ඉදිකරනු ලැබ ඇත්තාවූ ද ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් නිවාස යෝජනා ක්‍රමයක් ලෙස සහතික කරනු ලැබ ඇත්තාවූ ද යම් නිවාස සමූහයක් අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ;

"පොදු අංගෝපාංග" යන්නෙන් අදාළ ඒකකවලට අනුබද්ධ වූ ද, යම් ඒකකයකට ඇතුළත් නොවන්නාවූ ද දේපළෙහි යම් කොටසක් අදහස් වන අතර—

(1) මාර්ග සහ ප්‍රවේශයන් ද කාණු සහ අගල් ද පවුමාගී, ගෘහ උද්‍යාන, උද්‍යාන, ක්‍රීඩාංගන සහ වෙනත් එළිමහන් ප්‍රදේශ ද ඇතුළුව ඒකක ඇතුළත් ගොඩනැගිල්ල පිහිටි ඉඩම;

(2) අත්තිවාරම්, කුළුණු, මහා බාල්ක, බාල්ක, රුකුල්, ප්‍රධාන බිත්ති සහ පියසි;

(3) ගොඩනැගිල්ලේ ශාලා, පවු ආලින්ද, ප්‍රවේශ ශාලා, තරප්පු, සෝපාන මාර්ග, ගිනි කපොළු, ඇතුළුවීමේ දොරටු හා පිටවීමේ දොරටු;

(4) පතුල් මහල්, අංගන, ගෘහ උද්‍යාන, වාහන නතර කිරීමේ භූමි සහ ගබඩා භූමි;

(5) ආරක්ෂකයින් සහ මුරකරුවන් ද ඇතුළුව ඒකක භාරව සිටින තැනැත්තන්ගේ නවාතැන් ස්ථාන;

(6) විදුලි බලය, දුරකථන, ගුවන් විදුලි, රෙඩිෆියුෂන්, රූප වාහිනී, වායුසමීකරණ, කුණුකසළ බැහැර කිරීම සහ කුණු කසළ පිළිස්සීම වැනි සේවාවන් සඳහා සවි කිරීම්;

(7) පොදු පාවිච්චිය සඳහා පවත්නා ආරෝහණ, එස්කැලේටර්, ටැංකි, පොම්ප, මෝටර්, විදුලි පංකා, සම්පීඩක, නාලිකා හා සාමාන්‍යයෙන් පොදු පාවිච්චිය සඳහා පවත්නා සියලු උපකරණ හා සවිකිරීම්;

(8) සපයනු ලබන යම් සමාජ හා වෙළඳ පහසුකම්;

(9) ඒකකවල පැවැත්මට, නඩත්තුවට හා ආරක්ෂාවට අවශ්‍ය වන්නාවූ හෝ පහසු වන්නාවූ හෝ සාමාන්‍යයෙන් පොදුවේ පාවිච්චි කරනු ලබන්නාවූ ඒවායේ අන් සියලු කොටස් හා පහසුකම්

එයට ඇතුළත් වේ;

"පොදු පහසුකම්" යන්නෙන් වාසය සඳහා වූ ඒකක, දෙකක හෝ ඊට වැඩි ගණනක හෝ වාසය සඳහා නොවූ ඒකක දෙකක හෝ ඊට වැඩි ගණනක අයිතිකරුවන් විසින් හෝ පදිංචිකරුවන් විසින් හෝ පොදුවේ භුක්ති විඳිනු ලබන්නාවූ ද පුද්ගලිකව අයත් වූ හෝ පුද්ගලිකව සපයන ලද්දාවූ ද පහසුකම් අදහස් වන අතර පහත සඳහන් පුද්ගලිකව අයත් වූ හෝ පුද්ගලිකව සපයන ලද්දාවූ සේවාවන් සහ පහසුකම් ද ඊට ඇතුළත් වේ:—

ජලය, කසළ කාණු, ජලාපවහන, ගෑස්, විදුලි, කුණු කසළ බැහැර කිරීම, වායු සමීකරණ, දුරකථන සහ ගුවන් විදුලි සේවාවන් සහ මාර්ග ප්‍රවේශයන්, තණ පිට්ටනි, ගෘහ උද්‍යාන, උද්‍යාන, ක්‍රීඩාංගන සහ වෙනත් එළිමහන් ප්‍රදේශ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් ආධාරයක් වශයෙන් හෝ ණයක් වශයෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන් හෝ කොටසක් සපයන ලද ප්‍රාග්ධනයෙන් සමාගම් ආඥාපනත නොවන යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවනු ලබන යම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ;

"වාසය සඳහා වූ ඒකක" යන්නෙන් සභාධිපත්‍ය දේපළක හෝ ගෙපතක හෝ නිවාස යෝජනා ක්‍රමයක අන්තර්ගත වාසය සඳහා වූ ඒකක අදහස් වේ;

"සහාධිපත්‍ය දේපළ" යන්නෙන් මහල් එකකට වැඩි ගණනකින් යුක්ත වූ ද වාසය සඳහා වූ හෝ වාසය සඳහා නොවූ තනි ඉඩ ඒකක එකකට වැඩි ගණනක් ඇත්තාවූ ද, ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි ඇති ඉඩමකින් සමන්විත වන දේපළක් අදහස් වේ.

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.